# වත්මන් තරුණ පරපුරේ සමාජ මාධ්‍ය භාවිතයේ ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක් (සමාජ මාධ්‍ය ඇසුරින්)

*ඒ.පී.ඒ.එම්. කවිරත්න [1]*

ඕනෑම රටක තරුණ පරපුර යනු රටේ ජීවනාලියයි.අනාගත ශ්‍රම බලකාය වන්නේ ඔවුන්ය.තොරතුරු තාක්ෂණයේ දියුණුව හේතුවෙන් ගෝලීයකරණය වූ ලෝකයේ සමාජ මාධ්‍ය ඉතාමත් ජනප්‍රිය වේදිකාවකි.වත්මන් තත්ත්වය තුළ සමාජ මාධ්‍ය ඉතාමත් ජනප්‍රිය වේදිකාවක් බවට පත්ව ඇති අතර වත්මන් තරුණ පරපුර සීඝ්‍රයෙන් ඇදීයාමක් පැහැදිලිව දක්නට ලැබේ.ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ වත්මන් තරුණ පරපුරේ සමාජ මාධ්‍ය භාවිතයේ ප්‍රවණතා අධ්‍යයනය කිරීමය. උප අරමුණු ලෙස වත්මන් තරුණ පරපුර බහුලව භාවිතා කරන සමාජ මාධ්‍ය වර්ග මොනවාද? සමාජ මාධ්‍ය භාවිතා කරන්නේ කුමන කාර්යයන් සඳහාද, එමගින් අත්පත් කරගත් ධනාත්මක සහ ඍණාත්මක බලපෑම කෙසේද? සහ ඍණාත්මක බලපෑමෙන් මිදීමට ගත හැකි ක්‍රියා මාර්ග මොනවාද? යන්නය. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ක්‍රමවේද ද්විත්වය යොදා ගනිමින් මිශ්‍ර ක්‍රමවේදය මත පර්යේෂණය සිදු කර ඇත. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය පුස්තකාල සමීක්ෂණය ඔස්සේ ද්විතීක මූලාශ්‍ර වන සඟරා ලිපි අන්තර්ජාල පුවත් සහ අන්තර්ජාල යොදා ගනිමින් සිදුකරන ලදි. ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අන්තර්ජාල සම්බන්ධතා පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත අන්තර්ජාලය ඔස්සේ ලබාගන්නා ලදි. 2024 ජූලි මාසයට නියමිත ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය සංඛ්‍යා ලේඛන අනුව ෆෙස්බුක් 70.51%, යූටියුබ් 23.15%, පින්ටරෙස්ට් 3.05, ඉන්ස්ටර්ග්‍රෑම් 1.9%, ටුවිටර් 0.87%, රෙඩ්ඩිට් 0.26% සහ ලින්ක්ඩින් 0.22% පරිශීලනය කරන බව අනාවරණය විය. 2024 අගෝස්තු වන විට යූටියුබ්, ටික්ටොක්, ඉන්ස්ටර්ග්‍රෑම් සහ ෆෙස්බුක් සමාජ මාධ්‍ය වේදිකාවන් තුළ මූලිකත්වය ගෙන ඇත්තේ තරුණ පරපුර බව සංඛ්‍යා ලේඛන වලින් අනාවරණය විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ වත්මන් තරුණ පරපුර සමාජ මාධ්‍ය භාවිතයේ ප්‍රවණතා සඳහා බලපාන ලද හේතු ගණනාවක් මෙම අධ්‍යයනෙන් හඳුනා ගැනීමට හැකි විය.වෘත්තීය අවස්ථා විවර කර ගැනීම, තාක්ෂණික දැනුම පිළිබඳ අවබෝධය ලබා ගැනීමට, අධ්‍යාපන කටයුතු සඳහා යොදාගැනීම සහ ස්ව උත්සාහයෙන් නැගී සිටීමට මාර්ගය විවර කර ගැනීමද එහිලා බලපාන බව හඳුනා ගැනීමට හැකි විය.වත්මන් තත්වය තුළ රටේ පවත්නා අස්ථාවරභාවයට විසඳුමක් ලෙස රටේ අනාගත තරුණ පරපුර විසින් සමාජ මාධ්‍යයට යොමු වීම යහපත් ඵලදායී ක්‍රියාමාර්ගයක් බව ගම්‍ය විය.රටේ ජීවනාලිය වූ තරුණ පරපුර සමාජ මාධ්‍ය භාවිතා කිරීමේදී නිසි අවබෝධයකින් යුක්තව භාවිත කිරීමෙන් ඒ ඔස්සේ සිදුවිය හැකි ඍණාත්මක බලපෑම අවම කර ගැනීමට හැකිවේ.

***ප්‍රමුඛ පද:*** අධ්‍යයනය, තරුණ පරපුර, වත්මන්, වෘත්තීය, සමාජ මාධ්‍යය

[1]ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ayeshakavirathna443@gmail.com